# ශ්‍රී ලංකාවේ බන්ධනාගාර රැඳවියන් පිළිබඳ සංඛ්‍යාත්මක වාර්තාව








මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව
නිපුනතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යංශය

නදීකා හේරත්
මානව සම්පත් සංවර්ධන සහකාර

# ශ්‍රී ලංකාවේ බන්ධනාගාර රැඳවියන් පිළිබඳ සංඛ්‍යාත්මක වාර්තාව

## 01. හැඳින්වීම.

බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී යුගයේ සිදු කරන ලද අධිකරණ ප්‍රතිසංස්කරණයන්හි ප්‍රතිඵලක් ලෙස කැමරන් ආණ්ඩුකාරයා විසින් 1832 දි බන්ධනාගාර පිහිටුවන ලදි. මෙය බන්ධනාගාර කොමසාරිස්වරයෙකු යටතේ පාලනය වන වෙනම දෙපාර්තමේන්තුවක් ලෙස 1877 අංක 16 දරන බන්ධනාගාර පනතට අනුව 1905 ජූලි 16 දින සිට ක්‍රමවත් සහ විධිමත් ආකාරයෙන් වර්ධනය විය.

වර්තමානයේ අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය යටතේ පාලනය වන මෙම දෙපාර්තමේන්තුව මුල් කාලයේ සිරකරුවන්ට ආරක්ෂණය හා රැකවරණය ලබා දෙන ස්ථානයක් වුවද වර්තමානයේ ඉන් ඔබ්බට ගොස් සිරකරුවන්ව මනා පුනරුත්ථාපන ක්‍රියාවලියකට යොමු කරවන සමාජ විශෝධනාගාරයක් බවට පත්ව ඇත.

මේ ආකාරයෙන් විකාශනය වූ බන්ධනාගාර පද්ධතිය වර්තමානය වන විට දිවයින පුරා ව්‍යාප්ත පවතී.

## 02. ශ්‍රී ලංකාවේ බන්ධනාගාර.

- ආරක්ෂිත බන්ධනාගාර 04
  1. වැලිකඩ
  2. බෝගම්බර
  3. මහර
  4. අඟුණකොලපැලැස්ස

- වැඩ කඳවුරු 10
  1. හෝමාගම
  2. මීතිරිගල
  3. වීරවිල
  4. කුරුවිට
  5. වාරියපොල
  6. හංගිලිපොල
  7. කන්දෙවත්ත
  8. කඳුරුගස්ආර
  9. පිටබැද්දර
  10. අඹේපුස්ස

- රිමාන්ඩ් බන්ධනාගාර 18
  1. අනුරාධපුරය
  2. කොළඹ
  3. කළුතර
  4. මීගමුව
  5. ගාල්ල
  6. නව මැගසින්
  7. බදුල්ල
  8. මාතර
  9. මඩකලපුව
  10. කෑගල්ල
  11. ත්‍රීකුණාමලය
  12. යාපනය
  13. කුරුවිට
  14. බූස්ස
  15. මොණරාගල
  16. පොළොන්නරුව
  17. වාරියපොල
  18. වව්නියාව

- විවෘත වැඩ කඳවුරු 02
    1. පල්ලෙකැලේ
    2. අනුරාධපුරය

- තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථාන 03
    1. පල්ලන්සේන
    2. තල්දෙන
    3. වටරැක

- සිර මැදිරි 23
    1. අම්පාර
    2. අවිස්සාවේල්ල
    3. බලංගොඩ
    4. බලපිටිය
    5. හලාවත
    6. ඇල්පිටිය
    7. ඇඹිලිපිටිය
    8. ගම්පහ
    9. ගම්පොල
    10. හම්බන්තොට
    11. හැටන්
    12. කල්මුනේ
    13. කිලිනොච්චිය
    14. කුලියාපිටිය
    15. කුරුණෑගල
    16. මහව
    17. මන්නාරම
    18. මාතලේ
    19. මුලතිව්
    20. නුවරඑළිය
    21. පානදුර
    22. පේදුරු තුඩුව
    23. පුත්තලම

**03.** බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සංයුතිය

- බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
- අතිරේක බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
- බන්ධනාගාර කොමසාරිස්
- බන්ධනාගාර අධිකාරී
- ජේලර්
- පුනරුත්තාපන නිලධාරී
- බන්ධනාගාර සැරයන් හා නියාමක
- වෛද්‍ය නිලධාරී
- ඉංජිනේරු
- වධක

ඇතුළුව විවිධ තනතුරු වලින් සමන්විතවූ නිලධාරී මණ්ඩලයක් දෙපාර්තමේන්තුව සතු වේ.

ශ්‍රී ලංකාවේ බන්ධනාගාර ආයතන




*මූලාශ්‍රය :- ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව 2018*

රූප සටහන 01

**04.** බන්ධනාගාර රැඳවියන් (වාර්ෂික දත්ත අනුව)

- දිස්ත්‍රික් අනුව රැඳවියන්

| දිස්ත්‍රික්කය | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|
| කොළඹ | 11,223 | 8,465 | 9,037 | 8,821 |
| ගම්පහ | 1,666 | 2,605 | 2,079 | 2,174 |
| කළුතර | 882 | 1,894 | 1,593 | 1,724 |
| මහනුවර | 590 | 552 | 738 | 830 |
| මාතලේ | 418 | 257 | 476 | 302 |
| නුවරඑළිය | 288 | 378 | 226 | 231 |
| ගාල්ල | 1,011 | 1,192 | 1,096 | 1,379 |
| මාතර | 507 | 633 | 377 | 382 |
| හම්බන්තොට | 82 | 246 | 285 | 290 |
| යාපනය | 277 | 422 | 474 | 421 |
| මන්නාරම | 232 | 192 | 184 | 117 |
| වව්නියාව | 292 | 288 | 322 | 305 |
| මුලතිව් | 264 | 233 | 238 | 140 |
| කිලිනොච්චි | 337 | 355 | 98 | 214 |
| මඩකලපුව | 446 | 469 | 442 | 326 |
| අම්පාර | 375 | 425 | 300 | 384 |
| ත්‍රිකුණාමලය | 332 | 243 | 208 | 228 |
| කුරුණෑගල | 1,496 | 1,354 | 907 | 1,804 |
| පුත්තලම | 594 | 932 | 296 | 1,036 |
| අනුරාධපුරය | 896 | 914 | 1,120 | 919 |
| පොළොන්නරුව | 265 | 234 | 216 | 564 |
| බදුල්ල | 360 | 328 | 369 | 364 |
| මොණරාගල | 210 | 256 | 263 | 244 |
| රත්නපුර | 490 | 588 | 894 | 947 |
| කෑගල්ල | 553 | 604 | 595 | 706 |
| එකතුව | 24,086 | 24,060 | 22,833 | 24,852 |

*මූලාශ්‍රය :- ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව 2018*

වගු අංක 01

වගු අංක 01 ට අනුව සිරකරුවන් දිස්ත්‍රික් අනුව ව්‍යාප්ත වී ඇති ආකාරය පෙන්නුම් කරයි. සමස්ත සිරකරුවන් 2017 වර්ෂයේ දී යම් අඩු වීමක් පෙන්නුම් කලද 2018 වර්ෂය වන විට නැවත සිරකරුවන්ගේ ඉහළ යාමක් පෙන්නුම් කර ඇත. සෑම වර්ෂයකදීම වැඩිම සිරකරුවන් ප්‍රමාණයක් කොළඹ දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇති අතර අඩුවෙන්ම වාර්තා වී ඇත්තේ හම්බන්තොට, මන්නාරම, කිළිනොච්චිය වැනි දිස්ත්‍රික්ක වලිනි.

- අපරාධ අනුව රැඳවින් ඇතුලත් කිරීම

| අයිතමය | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|
| මිනීමැරුම් | 175 | 174 | 211 | 155 |
| මිනීමැරීමට තැත්කිරීම | 74 | 94 | 110 | 112 |
| සාපරාධී මනුෂ්‍ය ඝාතනය | 136 | 125 | 110 | 86 |
| සාපරාධී මනුෂ්‍ය ඝාතනයට තැත් කිරීම | - | 64 | 88 | 57 |
| පැහැරගෙන යාම් | 6 | 7 | 10 | 23 |
| ස්ත්‍රී දූෂණ | 211 | 199 | 148 | 201 |
| සුළු හා බරපතල තුවාල කිරීම් | 374 | 348 | 233 | 264 |
| සාපරාධී බලහත්කාරය සහ බය ගැන්වීම් | 50 | 50 | 18 | 19 |
| නීත්‍යානුකූල නොවන සංසර්ගය සහ උත්සාහ කිරීම | 35 | 18 | 28 | 11 |
| සිය දිවි හානි කර ගැනීම සහ ඊට උත්සාහ කිරීම | 9 | 13 | 13 | - |
| ගෙවල් බිඳීම සහ කොල්ලකෑම | 910 | 937 | 944 | 606 |
| අයුතු ලෙස ඇතුල් වීම, ගෙවල් බිඳීම සහ ගෙවල් බිඳින උපකරණ ළඟ තබා ගැනීම | 485 | 536 | 479 | 74 |
| පැහැර ගැනීම සහ මංකොල්ල කෑම | 504 | 671 | 312 | 331 |
| වංචා කිරීම සහ සාපරාධී ලෙස ගෙවල් බිඳීම | 369 | 379 | 485 | 267 |
| සොරකම | 1,218 | 1,220 | 1,278 | 1,075 |
| වෙනත් අපරාධ | 19,530 | 19,225 | 18,366 | 21,571 |
| එකතුව | 24,086 | 24,060 | 22,833 | 24,852 |

*මූලාශ්‍රය :- ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව 2018*

වගු අංක 02

අපරාධ අනුව වර්ග කර ඇති බන්ධනාගාර රැඳවියන් පිළිබඳව මෙම වගුව මඟින් විස්තර කර ඇත. වාර්ෂික දත්ත අනුව පැහැදිලි වන්නේ අනිකුත් වර්ෂ වලට සාපේක්ෂව 2018 වර්ෂය වන විට මිනීමැරුම්, සාපරාධී මනුෂ්‍ය ඝාතනය, සාපරාධී මනුෂ්‍ය ඝාතනයට තැත් කිරීම, නීත්‍යානුකූල නොවන සංසර්ගය සහ උත්සාහ කිරීම, ගෙවල් බිඳීම සහ කොල්ලකෑම, අයුතු ලෙස ඇතුල් වීම, ගෙවල් බිඳීම සහ ගෙවල් බිඳින උපකරණ ළඟ තබා ගැනීම, වංචා කිරීම සහ සාපරාධී ලෙස ගෙවල් බිඳීම හා සොරකම ආදී කරුණු සඳහා සිරගත වූවන්ගේ සංඛ්‍යාවේ අඩු වීමක් පෙන්නුම් කර ඇති බවයි. මෙම වගුවට අනුව වැඩිම සිරගත වීම් ප්‍රමාණයක් සිදුවී ඇත්තේ වෙනත් අපරාධ වීම ද විශේෂත්වයකි.

- දණ්ඩනයට පත්වන කාලය අනුව බන්ධනාගාර ගත වීම

| අයිතමය | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|
| මාසයකට අඩු | 2,243 | 4,774 | 4,316 | 4,082 |
| මාසයේ සිට මාස 6 දක්වා | 2,317 | 11,780 | 11,479 | 12,937 |
| මාස 6 සිට වර්ෂය දක්වා | 5,509 | 3,214 | 3,195 | 3,199 |
| වර්ෂයේ සිට වර්ෂ 2 දක්වා | 2,322 | 2,502 | 2,251 | 2,620 |
| වර්ෂ 2 සිට වර්ෂ 5 දක්වා | 1,043 | 1,203 | 989 | 1,435 |
| වර්ෂ 5 සිට වර්ෂ 10 දක්වා | 205 | 226 | 213 | 216 |
| වර්ෂ 10 ට වැඩි සහ මරණීය දණ්ඩනය ලත් | 447 | 361 | 390 | 363 |
| එකතුව | 24,086 | 24,060 | 22,833 | 24,852 |

*මූලාශ්‍රය :- ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව 2018*

වගු අංක 03

වගු අංක 03 ට අනුව පෙනී යන්නේ 2015 වර්ෂය හැර අන් සෑම වර්ෂයකදීම මාස 06 දක්වා කාලයක් සඳහා සිරගත වූවන් ප්‍රමාණය වැඩි අගයක් ගෙන ඇති බවයි.

- මරණීය දණ්ඩන

| අයිතමය | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|
| මරණීය දණ්ඩනය නියම වූ | 186 | 180 | 217 | 168 |
| මරණීය දණ්ඩනය වෙනස් කොට බන්ධනාගාරගත කළ සිරකරුවන් | 0 | 0 | 0 | 0 |
| මරණීය දණ්ඩනය ක්‍රියාත්මක කිරීමට හෝ අවසන් තීරණය ලිහිල් කිරීමට සිටින සිරකරුවන් | 186 | 180 | 217 | 168 |

*මූලාශ්‍රය :- ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව 2018*

වගු අංක 04

මෙම වගුව මඟින් මරණීය දණ්ඩනය නියම වූ පුද්ගලයන් පිළිබඳ තොරතුරු අනාවරණය කොට ඇත. ඒ අනුව මරණීය දණ්ඩනය නියම වූවන් 2017 වර්ෂයට අනුව 2018 වර්ෂයේ දී අඩු වී ඇත.

- බන්ධනාගාරයට ඇතුල්වීමේ අනුපාතය වාර්ෂිකව (පුද්ගලයින් 100,000 කට)

| වර්ෂය | අනුපාතය |
|---|---|
| 2015 | 115 |
| 2016 | 114 |
| 2017 | 107 |
| 2018 | 115 |

*මූලාශ්‍රය :- ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව 2018*

වගු අංක 05




රූප සටහන 02

වගු අංක 05 මඟින් සහ රූප සටහන 02 මඟින් පෙන්වා දී ඇත්තේ පුද්ගලයින් 100,000 කට බන්ධනාගාර වීමේ ප්‍රතිශතයයි. ඒ අනුව 2015 වර්ෂයේ සිට අඩු වෙමින් පැවතියද 2018 වර්ෂදී සාපේක්ෂව වැඩි වී ඇත.

- සිරකරුවන් පිළිබඳ විශ්ලේෂණය 2011 – 2017

| විස්තරය | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|---|---|
| සිරගත වූ මුළු සංඛ්‍යාව | 27,018 | 28,390 | 30,760 | 27,588 | 24,086 | 24,060 | 22,833 |
| කාන්තා සිරකරුවන් සංඛ්‍යාව | 773 | 946 | 894 | 834 | 759 | 895 | 565 |
| විවාහක මුළු සිරකරුවන් සංඛ්‍යාව<br>ප්‍රතිශතය | 14,470<br>(53%) | 16,962<br>(60%) | 19,215<br>(62%) | 17,953<br>(65%) | 12,652<br>(52%) | 15,760<br>(66%) | 14,164<br>(62%) |
| විවාහක කාන්තා සිරකරුවන් සංඛ්‍යාව | 523 | 713 | 622 | 555 | 473 | 629 | 408 |
| විවාහයෙන් දික්කසාද හා නිත්‍යානුකූලව වෙන්ව ඇති සිරකරුවන් සංඛ්‍යාව | 1,080 | 974 | 1,158 | 1,076 | 1,003 | 1,429 | 1,077 |
| සිංහල ජාතිකයින් සංඛ්‍යාව<br>ප්‍රතිශතය | 19,279<br>(71%) | 20,498<br>(72%) | 22,244<br>(72%) | 19,093<br>(69%) | 17,610<br>(73%) | 13,605<br>(57%) | 15,625<br>(68%) |
| දෙමළ ජාතිකයින් සංඛ්‍යාව<br>ප්‍රතිශතය | 4,164<br>(12%) | 4,058<br>(14%) | 4,592<br>(15%) | 4,459<br>(16%) | 3,473<br>(14%) | 5,172<br>(22%) | 4,008<br>(18%) |
| මුස්ලිම් ජාතිකයින් සංඛ්‍යාව<br>ප්‍රතිශතය | 3,299<br>(12%) | 3,618<br>(13%) | 3,623<br>(12%) | 3,759<br>(14%) | 2,950<br>(12%) | 5,095<br>(21%) | 3,128<br>(14%) |
| මත්ද්‍රව්‍යවලට වැරදිකරුවන් වූ මුළු සිරකරුවන් සංඛ්‍යාව<br>ප්‍රතිශතය | 10,568<br>(39%) | 9,281<br>(33%) | 10,448<br>(34%) | 11,990<br>(44%) | 11,171<br>(46%) | 10,586<br>(44%) | 10,586<br>(46%) |
| මත්ද්‍රව්‍යවලට වැරදිකරුවන් වූ කාන්තා සිරකරුවන් සංඛ්‍යාව | 152 | 151 | 113 | 168 | 178 | 142 | 157 |
| දඩ මුදල් ගෙවීමට නොහැකි වීම මත සිරගත වූ මුළු සිරකරුවන් සංඛ්‍යාව | 15,306<br>(57%) | 12,045<br>(58%) | 16,183<br>(53%) | 14,315<br>(52%) | 10,525<br>(44%) | 12,670<br>(53%) | 13,236<br>(58%) |
| දඩ මුදල් ගෙවීමට නොහැකි වීම මත සිරගත වූ කාන්තා සිරකරුවන් සංඛ්‍යාව | 183 | 171 | 155 | 135 | 69 | 74 | 67 |
| වයස අවු 40 ට වඩා අඩු වයසේ පසුවන මුළු සිරකරුවන් සංඛ්‍යාව<br>ප්‍රතිශතය | 16,172<br>(60%) | 16,571<br>(58%) | 19,203<br>(62%) | 16,995<br>(62%) | 14,610<br>(61%) | 14,834<br>(62%) | 11,822<br>(52%) |
| වයස අවු 40ට වඩා අඩු කාන්තා සිරකරුවන් සංඛ්‍යාව | 501 | 608 | 549 | 504 | 347 | 406 | 276 |
| දෙවන වර (නැවත) සිරගතවූ සිරකරුවන් සංඛ්‍යාව<br>ප්‍රතිශතය | 9,912<br>(37%) | 8,351<br>(29%) | 9,204<br>(30%) | 7,837<br>(28%) | 6,391<br>(27%) | 7,307<br>(30%) | 7,475<br>(33%) |
| තෙවන වර හෝ ඊට වැඩි වාර ගණනාවකදී සිරගත වූ සිරකරුවන් සංඛ්‍යාව<br>ප්‍රතිශතය | 5,868<br>(22%) | 7,512<br>(26%) | 7,110<br>(23%) | 4,731<br>(17%) | 3,793<br>(16%) | 6,271<br>(26%) | 4,571<br>(20%) |
| පාසැල් නොගිය සිර කරුවන් සංඛ්‍යාව | 1,350 | 1,920 | 1,538 | 1,540 | 1,099 | 1,523 | 1,376 |
| 8 ශ්‍රේණිය දක්වා පමණක් සමත් සිරකරුවන් සංඛ්‍යාව<br>ප්‍රතිශතය | 19,459<br>(72%) | 21,314<br>(75%) | 22,242<br>(72%) | 20,712<br>(75%) | 19,535<br>(81%) | 20,425<br>(85%) | 18,416<br>(81%) |
| උපාධිධාරී සිරකරුවන් සංඛ්‍යාව | 41 | 33 | 45 | 41 | 75 | 55 | 113 |
| මාස 06 කට වඩා අඩු කාලයකට සිරත වූ සිරකරුවන් සංඛ්‍යාව<br>ප්‍රතිශතය | 13,245<br>(49%) | 17,018<br>(60%) | 17,974<br>(58%) | 16,077<br>(58%) | 14,560<br>(60%) | 16,554<br>(69%) | 15795<br>(69%) |
| මරණ දණ්ඩනය ලැබී සිරගත වූ මුළු සිරකරුවන් සංඛ්‍යාව | 107 | 131 | 124 | 153 | 186 | 180 | 217 |
| මරණ දණ්ඩනය ලැබී සිරගත වූ කාන්තා සිරකරුවන් සංඛ්‍යාව | 08 | 09 | 04 | 02 | 07 | 04 | 13 |
| මරණ දණ්ඩනය ලැබී සිරගත වූ විවාහක සිරකරුවන් සංඛ්‍යාව | 88 | 108 | 96 | 116 | 159 | 151 | 202 |
| මරණ දණ්ඩනය ලැබී සිරගත වූ සිංහල ජාතික සිරකරුවන් සංඛ්‍යාව | 84 | 99 | 87 | 110 | 152 | 114 | 181 |
| මරණ දණ්ඩනය ලැබී සිරගත වූ සිංහල ජාතික බෞද්ධ සිරකරුවන් සංඛ්‍යාව | 78 | 91 | 78 | 98 | 124 | 102 | 164 |

*මූලාශ්‍රය :- සිරකරුවන්ට ආරක්ෂාව හා රැකවරණය සලසමින් ඔවුන් පුනරුත්ථාපනය කර සමාජ ගත කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ විගණකාධිපති විශේෂ වාර්තාව*

වගු අංක 06 හි සඳහන් පරිදි පාසැල් නොගිය සිරකරුවන් සංඛ්‍යාවේ සාමාන්‍ය 2011 හා 2017 කාල සීමාව තුලදි 1,478 ක් වේ. එම කාල සීමාව තුල සමස්ථ සිරකරුවන් සංඛ්‍යාවේ සාමාන්‍යය වූ 26,391 කින් සිරකරුවන් 20,300 දෙනෙකු 8 ශ්‍රේණිය දක්වා පමණක් සමත් වූ අය වී තිබීමත් විශේෂත්වයක් වේ. එසේම මරණ දණ්ඩණය ලැබී සිරගත වූවන්ගෙන් වැඩි පිරිසක් විවාහක සිරකරුවන් වන බව පෙනී යන අතර දෙවන හෝ තෙවන වරට වඩා වැඩි සංඛ්‍යාවක් සිරගත වූ සිරකරුවන්ගේ සංඛ්‍යාව ද සැලකිය යුතු මට්ටමක ඇත. මත්ද්‍රව්‍යවලට වැරදිකරුවන් වූවන්ගේ ප්‍රතිශතයද වාර්ෂිකව වැඩී ඇත. එසේම බන්ධනාගාර ගතවන්නන්ගෙන් බහුතරය ධරිද්‍රතාවයෙන් හා නූගත්කමෙන් පෙළෙන, නුපුහුණු ශ්‍රමය සහිත දැනුම, කුසලතා හා ආකල්ප දුර්වල මට්ටමක පවතින පුද්ගලයින් වන බවත් නිරීක්ෂණය වේ.

## 05. නිරීක්ෂණ

- අඩු අධ්‍යාපනය හා සිරගතවීම අතර ඍජු සම්බන්ධයක් පවතින බව තහවුරු වේ.
- සමස්ථ සිර ජනගහනය වැඩිවීම මෙන්ම උපාධිධාරී සිරකරුවන් සහ මරණ දණ්ඩනය ලැබී සිරගත වූ සිරකරුවන්ගේ වර්ධනයක් පෙන්නුම් කරයි.
- නැවත සිරගත වීම් සිදුවීම සැලකිය යුතු මට්ටමක පැවතීම.
- විවාහක සිරකරුවන්මේ වර්ධනය, විවාහයෙන් දික්කසද වූ හා නීත්‍යානුකූලව වෙන්ව ඇති සිරකරුවන්ගේ වර්ධනය සමස්ථයක් වශයෙන් ගත්කල රට තුළ සාමාජීය සංවර්ධනයට ඍජුව බලපාන ගැටළුවක් බව නිරීක්ෂණය වේ.

## 06. නිගමන

- සෑම දරුවකුටම පාසැල් අධ්‍යාපන අවස්ථා ලබා දීම හා දහම් අධ්‍යාපනය මඟින් විනයගරුක සමාජයක් ඇති කිරීම.
- නැවත සිරගත වීම් අවම කිරීම සඳහා නිසි නිර්මාණශීලී පුනරුත්ථාපන ක්‍රමවේදයන් අනුගමනය කිරීම.
- මත්ද්‍රව්‍ය සමස්ත සමාජයෙන් තුරන් කිරීම සඳහා පියවර ගැනීමට අවධානය යොමු කරවීම.
- විවාහක සිරකරුවන්ගේ කලත්‍රයන් සහ දරුවන් සමාජගත වීමේදී ඇතිවන දුෂ්කරතා මඟහරවා, නිසි පරිදි සමාජ ගත කර සමාජීය සංවර්ධනයට දායක කර ගැනීම.